# සංස්කෘතික උරුමය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහිලා පවතින විභවතා හා සංරෝධක පිළිබඳ අධ්‍යයනයක්: බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්

ආර්. එම්. මල්ෂා මධුශානි රණසිංහ

පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
rm.malsharanasinghe@gmail.com

---

සංස්කෘතික උරුමයෙහි උපකොටස් ද්විත්වයකි. එය භෞතික සාධක පදනම් කරගන්නා ස්පර්ශීය උරුමය හා මානවවංශ පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගන්නා නස්පර්ශී උරුමය ලෙසට හඳුනාගත හැකි ය. රටක හෝ කලාපයක කලාත්මක නිර්මාණ, සමාජ පුරුදු, සංස්කෘතිය හා කලාව පිළිබඳව මෙන් ම සාම්ප්‍රදායික ජන කොට්ඨාසයන් ඇතුළු ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව උනන්දුවකින් යුතු ව සංචරණය කිරීම සංස්කෘතික සංචාරක කර්මාන්තය වේ. සංස්කෘතික උරුමයන් කරා සංචාරකයින් ගෙන්වාගැනීමට නම්, ඒවා නිර්මාණශීලී ලෙස භාවිතයට ගැනීමට නිසි ක්‍රමවේදයන් සැකසීම වැදගත් ය. බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල කොට්ඨාසයේ සංස්කෘතික උරුමය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහි ලා පවතින විභවතා හා සංරෝධක හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම සිද්ධි අධ්‍යයනයේ දී ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයේ නියැලීම, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි හරහා දත්ත රැස් කිරීම සහ ද්විතීක දත්ත ලබාගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනයක් ද සිදුකරන ලදී.

මෙම පර්යේෂණයේදී ස්ථාන කිහිපයක සංස්කෘතික සංචාරක වැදගත්කම හඳුනාගනු ලැබිණි. බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල කොට්ඨාසයේ සොරගුණේ කුඩා කතරගම දේවාලයෙහි විශේෂිත චාරිත්‍ර වාරිත්‍ර මත පදනම් වූ වාර්ෂික පෙරහැර මංගල්‍යයන් හා විශේෂිත තේවාවන් සංචාරකයින්ට දුර්ලභ අත්දැකීම් ලබාදීමට සමත් වේ. දේවාලයෙහි මහනුවර යුගයේ ශෛලය දනවන කැටයම් ප්‍රාදේශීය වශයෙන් දුර්ලභ වේ. මනස්කාන්ත පරිසරයක නිර්මාණය කර ඇති වෑ එළිය වැව සංචාරකයින්ට සුවදායී නැරඹුමකි. නිකපොත, ගල්කන්ද ග්‍රාමයන්හි කුඹල් කර්මාන්තයේ දී සකපෝරුව භාවිතය සංචාරකයාට සාම්ප්‍රදායික අත්දැකීම් ලබාදීමට සමත් වේ. කිතුල් හා උක් භාවිත කරමින් සිදුකරනු ලබන පැණි හකුරු කර්මාන්තය සංචාරකයින්ට තවත් නව අත්දැකීමකි. ජන ජීවිතයට ආවේණික සාම්ප්‍රදායික කෘෂිරටා, ගවයින්ගෙන් සීසෑම, පැල් රැකීම, කමතේ ක්‍රියා නැරඹීමට, විඳීමට සංචාරකයෝ රුචි කරති. කොස්ගම, වෙලන්විට, මාලදොළ වැනි කෘෂි ගම්මාන ආශ්‍රිත ව මෙම ක්‍රියා අදටත් සිදුවේ. නීඩ්වුඩ්, බ්ලැක්වුඩ්, ඕක්වෙල් තේ යායන් සංචාරක ගමන ස්ථාන වන අතර ඒ ආශ්‍රිත කර්මාන්ත ශාලා කාර්මික උරුමයේ නව සංචාරක විභවතාවයකි. බෝගන්දන විහාරය, හල්දුම්මුල්ල බලකොටුව විනාශවෙමින් පැවතීම නිසා සංචාරක ආකර්ෂණයෙන් ඉවත් ව ඇත. ප්‍රාදේශීය ව පවතින අධ්‍යාපනික දුර්වලතා හා සංස්කෘතික උරුමයන්හි වැදගත්කම පිළිබඳ ප්‍රදේශවාසීන් මෙන් ම සංචාරක මාර්ගෝපදේශකයින්ගේ නොදැනුවත්කම සංස්කෘතික උරුමය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහි ලා පවතින සංරෝධක වේ. මාර්ග පද්ධතිවල දුර්වලතා මෙන් ම සංචාරක චාරිකා කට්ටල ලබාගෙන පැමිණෙන්නන්ගේ ගමන ස්ථානයන් අතරට සංස්කෘතික උරුමයන් ඇතුළත් නොවීම ද ගැටලුවකි. සංචාරකයින්ගේ නවාතැන් සඳහා ග්‍රාමීය නිවාස භාවිත කිරීම, ප්‍රාදේශීය ව සපයා ගත හැකි ද්‍රව්‍යයන් මඟින් ආහාර සකසාගැනීම, ප්‍රාදේශීය සංස්කෘතිකාංග හා පුරාණ ස්මාරක කෙරෙහි යොමුකරලීම හා සාම්ප්‍රදායික කර්මාන්ත හා කෘෂි ක්‍රියාවලීන් කෙරෙහි යොමුකර සහභාගීත්වය මගින් අත්දැකීම් ලබාගැනීමට පැකේජයක් හඳුන්වාදීම මෙහිලා වැදගත් වේ.

ප්‍රමුඛ පද : සංස්කෘතික උරුමය, සංචාරක කර්මාන්තය, සාම්ප්‍රදායික කර්මාන්ත, කෘෂිරටා, චාරිකා කට්ටල